**ශීර්ෂය 210 - රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

---

**1.1 තත්ත්වාගණනය කළ මතය**

---

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 25 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් වියහැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්විමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.

- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරිමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි.

- භාවිතාකරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරිම් අගයන ලදි.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරිම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදි.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5** **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1** **මූල්‍ය තත්ව ප්‍රකාශය**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී මූලධන වත්කම් අත්පත් කර ගැනිම සඳහා රු. 42,571,377 ක් වැයකර තිබූ නමුත් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය අනුව එය රු. 42,400,678 ක් වූයෙන් රු. 170,699 ක වෙනසක් නිරීක්ෂණය විය. | වැය කර ඇති සියලු වියදම් මූල්‍ය ප්‍රකාශන තුළ නියමිත පරිදි ඇතුළත් කළ යුතු වීම. | ලෙජරය අනුව රු.42,571,377 ක වියදමක් දරා තිබූ නමුත් දෙපාර්තමේන්තුව මඟින් මිලදී ගෙන ඇත්තේ රු.42,405,177 ක වත්කම් පමණි. |

**1.6.2** **මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| **(අ)** මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආදායම් නොවන ලැබීම් රු. 281,860 ක් හා වෙනත් ශීර්ෂ වෙනුවෙන් රැස්කළ ආදායම රු.13,885,179 ක් වශයෙන් දක්වා තිබුණි. එසේ වුවද ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව ආදායම් නොවන ලැබීම් ශීර්ෂයක් නොතිබූ අතර, වෙනත් ශීර්ෂ වෙනුවෙන් රැස්කළ ආදායම රු. 21,131,018 ක් විය. ඒ අනුව මුදල් | චක්‍රලේඛ උපදෙස් අනුව මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතු වීම හා ඒ අනුව ශේෂ පිරික්සුමේ අගයන් හා මුදල් ප්‍රවාහයේ අගයන් සමානවිය යුතු වීම. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වෙනත් ශීර්ෂ වෙනුවෙන් රැස්කළ ආදායම රු.13,885,813 ක් දක්වා තිබුණ ද ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව වෙනත් ශීර්ෂ වෙනුවෙන් රැස්කළ ආදායම රු.21,131,018 ලෙස දක්වා ඇත. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය රු. 6,963,979 ක් අඩුවෙන් නිරූපණය වී තිබුණි. | | |
| (ආ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අත්තිකාරම් අය කර ගැනීම රු. 452,413 ක් ලෙස දක්වා තිබුණ ද ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව එම අගය රු. 10,062,947ක් වූයෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය රු. 9,610,534 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ශේෂ පිරික්සුමේ හා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අගයන් සමාන වන පරිදි මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතු වීම. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අත්තිකාරම් අයකර ගැනීම රු. 452,413 ක් දක්වා තිබුණ ද ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව එම අගය රු. 10,062,947 ලෙස දක්වා ඇත. |
| (ඇ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ තැන්පත් ලැබීම් ලෙස රු. 257,225 ක් දක්වා තිබුණ ද ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව එම අගය රු. 1,302,547 ක් වූයෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය රු. 1,045,322 කින් අඩුවෙන් දක්වා තිබුණි. | - එම - | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ තැන්පත් ලැබීම් ලෙස රු.257,222 ක් දක්වා තිබුණ ද ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව එම අගය රු. 1,302,546 ලෙස දක්වා ඇත. |
| (ඈ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් ලෙස රු. 230,937,450 ක් දක්වා තිබුණ ද ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව එම අගය රු. 248,176,053 ක් වූයෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය රු. 17,238,603 කින් අඩුවෙන් දක්වා තිබුණි. | ශේෂ පිරික්සුමේ හා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අගයන් සමාන වන පරිදි මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතු වීම. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් ලෙස රු.230,937,449 ක් දක්වා තිබුණ ද ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව එම අගය රු.248,176,052 ලෙස දක්වා ඇත. |
| (ඉ) | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම හා වෙනත් අයෝජන අත්කර ගැනීම් ලෙස රු. 62,281,390 ක් දක්වා තිබුණ ද ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව එම අගය රු. 62,662,622 ක් වූයෙන් ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය රු. 381,232 ක් අඩුවෙන් දක්වා තිබුණි. | වැය කර ඇති සියලු වියදම් මූල්‍ය ප්‍රකාශන තුළ නියමිත පරිදි ඇතුළත් කළ යුතු වීම. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් ලෙස රු.62,281,389 ක් දක්වා තිබුණ ද ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව එම අගය රු.62,662,622 ලෙස දක්වා ඇත. |

**1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| හානි පිළිබඳ ලේඛනය<br>මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව පවත්වාගෙන යා යුතු හානි පාඩු පිළිබඳ ලේඛනයෙහි සමාලෝචිත වර්ෂයේදී සිදුවූ වාහන අනතුරු 3 කට අදාළව හානියේ වටිනාකම, අලුත්වැඩියා කිරීමට යන වියදම, අයකර ගත හැකි වටිනාකම යනාදී විස්තර ඇතුළත් කර හානි පාඩු ලේඛනය යවත්කාලීනව පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා ගත යුතු වීම. | වාහන අනතුරු සම්බන්ධව අදාළ පරීක්ෂණ කටයුතු තවදුරටත් කෙරෙමින් පවතී. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පුනරාවර්ථන වැයවිෂයන් 04 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 9 ක සිට සියයට 68 ක් දක්වා ඉතිරිවීම් පැවති අතර එම වැයවිෂයයන්ට අදාලව ඇස්තමේන්තු කිරීමේ දුර්වලතා සිදුවී ඇති බව නිරීක්ෂණය විය. | මුදල් රෙගුලාසි. 50 ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. | අවශ්‍යතා ඇති නොවීමත් අපේක්ෂිත කාර්යයන් ඉටු නොවීමත් නිසා ප්‍රතිපාදන ඉතිරි වීම. |

**2.2** බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ)** 2020 මැයි 31 දින වනවිට වවුචර්පත් මඟින් ගෙවීම් කර තිබූ රු.595,812 ක් වූ බැරකම් වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල බැරකම් ලෙස සටහන් වී නොතිබුණි. | මුදල් රෙගුලාසි 150 ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඇති සියලු බැරකම් හෙළිදරව් කළ යුතු වීම. | විගණන නිරීක්ෂණය නිවැරදියි. |
| **(ආ)** මුදල් රෙගුලාසි 94(1) ප්‍රකාරව බැරකම් හා බැඳීම්වලට එළඹීමේදී කිසිම විටෙක මුදල් වර්ෂය සඳහා ඇති ප්‍රතිපාදන නොඉක්මවිය යුතු නමුත් වැය විෂයන් 09 ක ප්‍රතිපාදන ඉක්මවා එකතුව රු.11,842,717 ක් බැරකම්වලට එළඹ තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව බැරකම් ප්‍රමාණය එම වර්ෂයේ ප්‍රතිපාදනය නොඉක්මවිය යුතු වීම. | දෙපාර්තමේන්තුවේ ඒ වන විට පැන නැගුණු අවශ්‍යතා මත හා මු.රෙ.94(2) අනුව මෙම බැරකම්වලට එළඹීමට සිදුව ඇත. |

**2.3** තැන්පත් ශේෂයන්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එකතුව රු. 7,488,595 ක් වූ කල් ඉකුත් තැන්පතු මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව රාජ්‍ය ආදායමට බැර කිරීමට හෝ හැකි ඉක්මනින් ආපසු ගෙවීමට හෝ කොන්ත්‍රාත් තැන්පතු සම්බන්ධයෙන් වූ විට කොන්ත්‍රාත්තු වලින් වූ අලාභ ආපසු අයකර ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි. | කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | කොන්ත්‍රාත්තුවේ පවතින ගැටළු හේතුවෙන් මෙම මුදල නිදහස් කර නොමැත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුව විසින් උපායමාර්ග 07 කට අදාළ ක්‍රියාකාරකම් 64 ක් ඉටු කළ යුතුව තිබුණත් ඉන් ක්‍රියාකාරකම් 06 ක් ඉටුකර නොතිබුණි. | සමාලෝචිත වර්ෂයේදී ඉටු කළයුතු කාර්යභාරයන් සැලසුම් කළ පරිදි ඉටු කළ යුතු වීම. | ත්‍රිමාණ සජීවීකරණ වැඩසටහන් රජයේ චිත්‍රපට අංශය මගින් නිෂ්පාදනය කිරීමට ඉල්ලීම් නොලැබුන බැවින් එම වැඩසටහන් නිෂ්පාදනය කිරීම සිදු නොවූ අතර, දෙසතිය සඟරාවට සමගාමීව පල කිරීමට නියමිත තිංගල් දමිළ මාධ්‍ය සඟරාව සඳහා සුදුසු කාර්ය මණ්ඩලයක් නොමැති වීමෙන් එය පල නොකිරීමට ප්‍රධාන හේතුවක් විය. පාසල් ජනමාධ්‍ය විෂය ගුණාත්මකව වර්ධනය කිරීම සඳහා විෂය භාර ආචාර්යවරුන්ගේ දැනුම ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් පැවැත්වීමට නියමිතව තිබූ සම්මන්ත්‍රණය ද 2019 පාස්කු ප්‍රහාරය සමඟ ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. |

### 3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබූ ක්‍රියාකාරකම් 64 කින් රු.මිලියන 12.5 ක ප්‍රතිපාදන සලසා තිබූ ක්‍රියාකාරකම් 08 ක් අපේක්ෂිත නිමැවුම් මට්ටම අත් කරගෙන නොතිබූ අතර, එය සියයට 12 ක සිට සියයට 96 ක් දක්වා වූ පරාසයක් ගෙන තිබුණි. | සමාලෝචිත වර්ෂයේ ඉටු කළයුතු කාර්යභාරයන් සැලසුම් කළ පරිදි ඉටුකළ යුතු වීම. | දෙසතිය සඟරා - වාර්ෂික කලාප 24 න් 3ක් නොවැලැක්විය හේතුවක් නිසා මුද්‍රණය කිරීමට නොහැකි වීමත් එවකට පැවති රජය කැබිනට් තීරණ ප්‍රකාශයට පත්කිරීමේ ප්‍රවෘත්ති සාකච්ඡා අත්හිටුවීමත් පැවති දේශපාලන වාතාවරණය හා වර්ෂ අවසානයේ පැවති ජනාධිපතිවරණයත් පාස්කු ප්‍රහාරයත් ඇතැම් ක්‍රියාකාරකම් 2021 වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරීමට කල් දැමීමත් හේතු විය. |

## 3.3 ප්‍රසම්පාදනය

--------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1(ඉ) මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්ම මාස හයකට වැඩි නොවන කාලයක් තුළදී නිතිපතා යාවත්කාලීන කළ යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි. | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1(ඉ) අනුව ඉදිරියේදී කටයුතු කරන බව කාරුණිකව දන්වමි. |
| (ආ) | ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 (අ) මාර්ගෝපදේශය අනුව ප්‍රසම්පාදන කටයුත්තක් ආරම්භ කරන අවස්ථාවේ සිට අවසන් කරන තුරු එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවරයන් ක්‍රමානුකූලව විස්තර කරමින් ප්‍රසම්පාදන කාල සටහනක් සකස් කළයුතු වුවද එසේ සකස් කර නොතිබුණි. | -එම- | ප්‍රසම්පාදන කාලසටහනද ඇතුළත් කරමින් ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කොට ඇත. |

## 3.4 පාඩු හා හානි

---------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2019 වර්ෂයට අදාළව සිදු වූ වාහන අනතුරු 2 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 හා 105 ප්‍රකාරව වගකිව යුත්තන් හඳුනා ගැනීම, අලාභ හානි සම්බන්ධව අය කර ගැනීම් සඳහා ක්‍රියාමාර්ග ගැනීම් ආදිය වෙනුවෙන් ප්‍රාරම්භක පරීක්ෂණයක් පවත්වා නොතිබුණි. | අනතුරක් සිදුවූ පසු හැකි ඉක්මනින් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | මෙම අනතුරු සම්බන්ධයෙන් අදාළ නිලධාරීන්ගෙන් සටහන් ලබා ගනිමින් පරීක්ෂණ කටයුතු ආරම්භ කර ඇති අතර, ඉදිරි කටයුතු කෙරෙමින් පවතී. |

| | | | |
|---|---|---|---|
| (ආ) | හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරයෙකුට නිකුත් කරන ලද ජංගම දුරකථනය හා උකුල් පරිගණකය 2020 නොවැම්බර් වන විටත් ආපසු භාරදී නොතිබුණු අතර, ඒවා 2014 හා 2015 වර්ෂවල භාණ්ඩ සමීක්ෂණ වාර්තාවල ඌනතාවයන් ලෙසද දක්වා තිබුණි.භාණ්ඩ බාර නොදී වර්ෂ 05 කට වැඩි කාලයක් ගත වී තිබුණ ද,එම නිලධාරියාට විරුද්ධව 2020 සැප්තැම්බර් වන විටත් මුදල් රෙගුලාසි ප්‍රකාරව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අලාභය හෝ හානියේ වටිනාකම අදාළ නිලධාරියාගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | මෙම උපකරණ දෙපාර්තමේන්තුව වෙත නැවත භාරදීම සම්බන්ධයෙන් අදාළ නිලධාරියා සමඟ දුරකථනයෙන් සාකච්ඡා කරන ලද අතර, හැකි ඉක්මනින් එම උපකරණ නැවත දෙපාර්තමේන්තුව වෙත භාර දෙන බව නිලධාරියා පවසන ලදි. |

## 3.5 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සේවය අතහැර ගොස් ඇති නිලධාරීන් දෙදෙනකුගෙන් අයකර ගත යුතු වර්ෂ 18 කට වඩා පැරණි රු.195,040 ක ණය ශේෂ 2020 ජූනි මාසය වන විටත් අය කරගැනීමට කටයුතු කර නොතිබුණි. | ණය ශේෂ අයකර ගැනීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 4 වන වගන්තියේ සඳහන් විධිවිධාන අනුගමනය කළ යුතු වීම. | අප විසින් එකී සියලුම ලිපිවල පිටපත් 2020.02.24 දින රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර ඒ සඳහා අනුමැතිය ලැබුණු පසු ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ඇත. |
| (ආ) | වැඩ තහනම් කර ඇති නිලධාරියෙකුගෙන් අයකර ගත යුතු මාස 03 ට වඩා වැඩි රු.244,390 ක ණය ශේෂය 2020 නොවැම්බර් වන විටත් අය කරගෙන නොතිබුණි. | -එම- | විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා අවසන් තීරණයක් ලබාදෙන තෙක් 2020.03.19 දින සිට ක්‍රියාත්මක වන පරිදි අඩ වැටුප් ගෙවීම ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කර ඇති අතර, අඩ වැටුප් ගෙවීමේදී නිලධාරියාගේ ආර්ථික අපහසුතාද සැලකිල්ලට ගෙන වැන්දඹු අනත් දරු ආයක මුදල්, අග්‍රහාර රක්ෂණ මුදල් සහ මුද්දර ගාස්තු පමණක් අයකර ඇත. |

**4. යහ පාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (1) වගන්තිය හා මුදල් රෙගුලාසි 133 අනුව 2020 සැප්තැම්බර් වන විටත් දෙපාර්තමේන්තුව සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනත හා මුදල් රෙගුලාසි ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීමට කටයුතු කළ වීම. | අභ්‍යන්තර විගණන තනතුරෙහි පුරප්පාඩුව රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය විසින් නිලධාරියකු පත්කර එවීම මඟින් සම්පූර්ණ කළයුතු වේ. |